# ගාථාව පිළිබඳ ථෙරවාදී විග්‍රහයක්

*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය දොඩම්කුඹුරේ ධම්මදස්සී හිමි*

කාව්‍යකරණයේ දී උපයුක්ත වන ශෛලීන් ලෙස ගද්‍ය පද්‍ය සහ ඒ දෙකෙහි සංයෝජනයෙන් නිපන් චම්පූ යන ප්‍රභේදය අපට හඳුනාගත හැකි ය.[1] මේ අතර පද්‍යය, සිංහලයෙහි කවි යනුවෙන් ද සංස්කෘතයෙහි ශ්ලෝක යනුවෙන් ද පාලියෙහි ගාථා යනුවෙන් ද හැඳින්වේ. කාව්‍යයේ දී පද්‍යයේ උපයෝගීතාව ඉමහත් ය. එබැවින් පාලි ත්‍රිපිටකයේ ඒ සඳහා විශේෂ ස්ථානයක් හිමි වේ. ලේඛන කලාව වර්තමානයේ මෙන් දියුණු තත්ත්වයක නො තිබූ භාරතයේ ධර්මපාඨ ගාථා වශයෙන් වාචෝද්ගත කොට ඒවා ස්මෘතියෙහි රඳවා ගැනීම විශේෂ සහ වැදගත් ක්‍රමෝපායක් විය. සාමාන්‍යයෙන් ගද්‍ය වශයෙන් යමක් සිතෙහි ධාරණය වශයෙන් කර ගැනීමට වඩා පද්‍ය වශයෙන් සිතෙහි ධාරණය කර ගැනීම පහසු ය.[2] පාලි ත්‍රිපිටකයේ සහ අට්ඨකථාවල ගාථාවේ භාවිතය හා එහි උපයෝගීතාව අවධාරණය වූ ආකාරයත් එමගින් ජනිත කරවන්නා වූ

1. *"..... ගද්‍යං පද්‍යඤ්ච මිශ්‍රඤ්ච - තත් ත්‍රිධෛව ව්‍යවස්ථිතම්"* - කාව්‍යාදර්ශය, වැලිවිටියේ ප්‍රේමරතන/හල්ගස්තොට දේවානන්ද සංස්කරණය, 2001, කොළඹ, 6 පිටුව.
2. *"..... At a period in which the writing meterials were not known, it was tremendously helpful to keep the text in memory and to hand them down from mouth to mouth....."* **A Historical and Textual Analysis of Khuddaka Nikaya,** Oliver Abeynayaka, 1984, colombo, p. 24.